# ශ්‍රී ලාංකේය රාජත්වය කෙරෙහි බෝධිසත්ත්ව හා දේවත්ව සංකල්පයේ බලපෑම

**ආර්.එම්.ජී. වසන්ත දිසානායක[1], විල්ගමුවේ පියනන්ද හිමි[2]**

## හැඳින්වීම

භාරතය කේන්ද්‍ර කරගත් හින්දු හා බෞද්ධ ආගමික සම්ප්‍රදායන්ට අනුව රාජත්වය, දේවනිර්මාණවාදය හා මහජන සම්මුතිවාදයට අනුව ගොඩනැගුණි. රාජත්වයේ මූලික අරමුණ වූයේ වැරදි කරුවන්ට දඬුවම් කොට රට තුළ නීතිය මැනවින් ස්ථාපිත කිරීමයි. පුරවැසියා අපේක්ෂිත එම අරමුණු ක්‍රියාත්මක කිරීමට නම් පාලකයා ඍජු, ක්‍රියාශීලී මධ්‍යස්ථ චරිතයක් විය යුතු ම ය. ඔහු කිසි විටෙකත් දැඩි මෘදු බව හා දරදඬු බව ප්‍රකට නොකළ යුතු ය. රාජත්වයට නොගැළපෙන මෘදු හා දැඩි බව රාජ චරිත තුළින් ප්‍රකට වනුයේ ආගමික මතවාදවලින් මුසපත් වූ විට ය. අනවශ්‍ය මෘදු බව හා දරදඬු බව මෙරට පාලන නායකත්වය හා පාලන තන්ත්‍රයට බද්ධ වූයේ බෝධිසත්ත්ව හා දේවත්ව සංකල්පවල බලපෑම මත ද? යන්න මෙයින් විමසා බැලේ. බොහෝ දේශපාලන චරිත ආගමික මතවාද ඔස්සේ සිය චරිත මෙන්ම පාලන තන්ත්‍ර හසුරුවා ගැනීමට උත්සුක වී ඇති බැවින් බෝධිසත්ත්ව හා දේවත්ව සංකල්ප මෙරට දේශපාලන හා බද්ධ වෙමින් ඉස්මතු වූ ආකාරයත් ඒවා රාජත්වයට හා පාලන තන්ත්‍රයට බලපෑම් කළ ආකාරයත් මෙයින් අධ්‍යයනය කෙරේ.

## අරමුණු

බෝධිසත්ත්ව හා දේවත්ව සංකල්ප මෙරට තුළ ඉස්මතු වූ ආකාරය හා එම සංකල්ප රාජත්වය හා බද්ධ වූ ආකාරයත්, එහි බලපෑම මත පාලකයන්ගේ පෞද්ගලික ජීවිතවල මෙන්ම පාලන තන්ත්‍රය තුළ සිදු වූ සුවිශේෂිත වෙනස්කම් හඳුනාගැනීම මෙහි අරමුණ ය.

## පර්යේෂණ ක්‍රමවේදය

ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයට අනුගත මෙම පර්යේෂණ ක්‍රියාවලියේදී මෙරට ලියැවුණු දීපවංසය, මහාවංසය හා හත්ථවනගල්ලවිහාරවංශය වැනි ප්‍රධාන වංසකථා හා අනෙකුත් ප්‍රාථමික හා ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය හා ශිලාලේඛන ප්‍රමුඛ කරගත් පුරාවිද්‍යා මූලාශ්‍රය තුළ සඳහන් කරුණු විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කෙරේ.

1 ඉතිහාසය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව.
wasanthad@kln.ac.lk

2 බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය
wilpiyananda@busl.ac.lk

**සාකච්ඡාව**

**බෝධිසත්ත්ව සංකල්පය හා රාජත්වය**

බෞද්ධාගමික සම්ප්‍රදායේදී 'දසපින්කිරියවත්, සතරසංග්‍රහ වස්තුව, සතර අගතිය, දසරාජ ධර්ම' ආදි කරුණු බෝධිසත්ත්ව සංකල්පය මතු කළ අතර රාජත්වයේ හා රාජසභාවේ මූලික පරමාදර්ශයේ පදනම ලෙස ද සලකන ලදී. මෙරට පාලන නායකත්වයට බෞද්ධාගමික සම්ප්‍රදාය බලපා ඇති ආකාරය පැහැදිලි වනුයේ ... ලක්දිවැ බුධශාසනයට ප්‍රතිපක්ෂ අබෞධ චොඩ පාඬ්‍යාදි රජුන් නොපිහිටිවියැ යුත්තේයැ...'' (EZ.Vol.II. (1928), p.109) යනුවෙන් නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත ශිලා ලිපියේ විස්තරයෙනි. චෝළ, පාණ්ඩ්‍ය, කේරළාදි වංශිකයන් අබෞද්ධයන් වන බවත් එබැවින් ඔවුන්ට මෙරට සිංහාසනයට උරුමයක් නැති බවත් මෙරට සිංහාසනය බෞද්ධයන්ට පමණක් උරුම වූ එකක් බවත් මෙයින් අවධාරණය කර තිබේ.

මීට අමතරව ''ල(ක්හි) නො බොසත්හු නො රජ්වන්හයි සැහැකුල කොත් ...සවැනිය මුනිරජ්හු... (වියාරණ්) ලද් තමා...'' (E.Z.Vol.I. (1912), p.234) යනුවෙන් බෝධිසත්ත්වයකු නොවන අයෙක් මෙරට රජ නොවිය යුතු බවත්, එය බුදුන්වහන්සේගේ විවරණයක් බවත් අවධාරණය කර තිබේ. එයින් පෙන්වා දීමට උත්සාහ කරනුයේ මෙරට රාජත්වය බෞද්ධාගමික සම්ප්‍රදාය ඔස්සේ ගොඩනැගිය යුතු බවත් දේශපාලන නායකත්වය බෞද්ධ උපාසක තත්ත්වයෙන් ඔබ්බට ගොස් පරාර්ථකාමී බෝධිසත්ත්වයකු ද විය යුතු ය යන අදහස සමාජගත කොට තිබේ.

බෝධිසත්ත්ව සංකල්පයෙන් ඔබ්බට ගොස් රජු බුදුන්වහන්සේ සේ සැලකූ අවස්ථා ද මෙරට ඉතිහාසය තුළ නිරීක්ෂණය කළ හැකි ය. ... (මැඳහත්) රජුන් ලැබීම බුදුන් ලැබීම්සේ සැලකිය යුතුයැ'' (E.Z.Vol.II.(1928), p.108) යනුවෙන් නිශ්ශංකමල්ල රජතුමා මැද මාවතේ පාලන කටයුතු මෙහෙයවන පාලකයා බුදුන් වහන්සේට සමාන කොට දැක්වීමට උත්සාහ කර තිබේ. බෞද්ධ උපාසක තත්ත්වයේ සිට බෝධිසත්ත්ව හා අවසානයේ බුද්ධත්වය දක්වා වූ පරාර්ථකාමී දේශපාලන නායකත්වයක් මෙයින් නිරූපණය වේ.

මහායානය හා සම්බන්ධ බෝධිසත්ත්ව සංකල්පය මෙරට රාජත්වය හා මුලින් ම සම්බන්ධ වන්නේ සිරි සංඝබෝධි රජ දවසේදී ය. (ක්‍රි.ව. තෙවන සියවස) ඔහුගේ චරිත කථාවෙන් බෝධිසත්ත්වවරයකු මෙන්ම සක්විති පාලකයකුගේ ස්වභාවය ද ප්‍රකට කරයි. මෙතුමා පිළිබඳව දීපවංසය ගාථා දෙකකින් ද, (දීපවංසය, (1959), පරි. 22. ගාථා. 51,52) මහාවංසය ගාථා විසි පහකින් ද (ඌනපූරණසහිතො මහාවංසො, (1959), පරි. 36. ගාථා. 73-97) තොරතුරු ගෙනහැර දක්වා තිබේ. මීට අමතරව මොහු පිළිබඳව පූජාවලිය, රාජාවලිය, රාජරත්නාකරය හා හත්ථවනගල්ලවිහාරවංසය යන සාහිත්‍ය මූලාශ්‍රය තුළ ද තොරතුරු ඇතුළත්ව තිබේ (හත්ථවනගල්ලවිහාරවංසය, (2001).

බුද්ධ දේශනාවේ ඉගැන්වෙන 'සතර සංග්‍රහ වස්තුව, දශරාජ ධර්ම, සක්විති වත් හා සතර අගතියෙන් තොරවීම' ආදි රාජ ධර්ම ප්‍රායෝගිකව ජීවිතයට එකතුකරගත් සිරිසඟබෝ රජු සාධුත්වයකින් පිරිපුන් ආදර්ශමත් රාජ්‍යත්වයක් ගොඩනගා ගත්තේ ය. ඔහු කිසිසේත් බලයට තණ්හා නොවූයේ ය. ඔහුගේ චරිත කථාවෙන් ප්‍රකට කරනුයේ

'දල්හනේමි' සත්විති රජතුමාගේ චරිත ලක්ෂණයයි (දීඝනිකාය, තෙවන කොටස, (1976), පිටු. 98 - 100) '(හත්ථවනගල්ල විහාරවංස, (2001), පිටු.9,17,18). බෝධිසත්ත්ව ගුණයන්ගෙන් උපලක්ෂිත සිරි සංඝබෝධි රජු මලලසේකර මහතාට අනුව අසාර්ථක දේශපාලන චරිතයකි. ඔහුගේම වචනවලින් කිවහොත් 'ඔහු කාල්පනික ලෝකයේ ජීවත් වූවෙකි. විඥානවාදියෙකි. ස්වර්ගයට කැප වී මිහිපිට ජීවත් වූවෙකි. ලෞකික වශයෙන් කල්පනා කරන විට ඔහුගේ රාජ්‍ය ජීවිතය විපත්ති දායක අසාර්ථක එකකි' (ගුණපාල මලලසේකර, (1965), පි. 36).

මහාවංසයේ සඳහන් වන ආකාරයට බුද්ධදාස රජතුමා ද බෞද්ධ ඉගැන්වීම්වලට අනුගතව රට පාලනය කළ බෝධිසත්ත්ව ගුණාංගවලින් පිරිපුන් පාලකයෙකි (මහාවංසය, ද්විතීය භාගය, (2015), පරි. 37. ගාථා. 130, 131). ආමණ්ඩගාමණී රජු හා සිවුවන කාශ්‍යප රජු ද ද එවැනි ගති ලක්ෂණ ඇති පාලකයන් ය (මහාවංසය, ප්‍රථම භගය, (2014), පරි.35.ගා.7). මෙම පාලකයන්ට අමතරව නිශ්ශංකමල්ල රාජ චරිතයෙන් ද බෝධි සත්ත්ව චරිතයක ගති ලක්ෂණ ප්‍රකට කරවයි (E.Z.Vol.II.pp.(1928), pp. 129,132,154).

ශිලාලේඛන මූලාශ්‍රයට අනුව පළමු වන විජයබාහු රජු (1055 - 1110) ''සිරිසඟබො...'' (E.Z.Vol. IV. (1944), p. 71) යනුවෙන් ද, පළමු වන පරාක්‍රමබාහු රජු (1153-1186) ''...ශ්‍රී සංඝබෝධි'' (1153 - 1186), (E.Z.Vol.II. (1928), pp. 193, 263) යනුවෙන් ද, නිශ්ශංකමල්ල රජු (1187 - 1196), 'ශ්‍රී සිරිසඟබො' (EZ.Vol.II. (1928), p.96) යනුවෙන් ද, ලෝකේශ්වර රජු ''සිරිසඟබො ලොකෙශ්වරබාහු'' (E.Z.Vol.IV. (1944), p.87) යනුවෙන් ද, සංඝබෝධි විරුදය භාවිත කරමින් තමන්ගේ බෝධිසත්ත්ව බව ප්‍රකට කිරීමට උත්සාහ ගෙන තිබේ. දේශපාලකයකු වශයෙන් සිරි සංඝබෝධි රජු අසාර්ථක වූයේ නමුත් එම චරිතයෙන් ප්‍රකට කළ බෝසත් ගති ලක්ෂණ නිසා පසුකාලීන මෙරට පාලකයන් එම රාජ නාමය සිය නමට පූර්වයෙන් යොදා ගැනීමට රුචිකත්වයක් දැක් වූ බව ඉහත සඳහන් මූලාශ්‍රය තුළින් පැහැදිලි කරගත හැකි ය.

මෙරට පාලකයන් තම පාලන තන්ත්‍රය දශරාජ ධර්ම පාලන මූලධර්මවලට අනුගතව කළ බව ''...දශරාජධම්මී නොකොපො... සිරිසඟබො විජයබාහු දෙවයන්...'' (E.Z.Vol.IV.(1944),p.71) යනුවෙන් පළමු විජයබාහු රජු ද, ''...ලක්දිව වැඩැ දශරාජධම්මී යෙන් රාජ්‍ය කෙරෙමින්'' (E.Z.Vol. II. (1928), p. 135) යනුවෙන් නිශ්ශංකමල්ල රජු ද, ''අභා සලමෙවන් ලීලාවතී... දසරාජ ධම්මීයෙන් රජ කරනසෙයෙක්'' (E.Z.Vol. III. (1933), p.71) යනුවෙන් ලීලාවතී රැජින ද සඳහන් කොට ඇත්තේ මේ ආකාරයෙනි. මෙම කරුණුවලින් පොළොන්නරුවේ රාජප්‍රාප්ත පාලකයන් බෝධිසත්ත්ව සංකල්පය රාජත්වය හා සමීප කොට ප්‍රචාරය කිරීමට උත්සාහ දරා ඇති බවක් මෙයින් පෙනී යයි.

**දේවත්ව සංකල්පය හා රාජත්වය**

රාජත්වය හා සම්බන්ධ දේවත්ව සංකල්පය හින්දු ආගමික සම්ප්‍රදාය ඔස්සේ ජනිත වූවකි. වෛදික යුගයේදී ඉන්ද්‍ර දෙවියාට සියලු බලතල හිමි විය. ඉන් අනතුරුව ප්‍රජාපතිට මැවුම්කරුවාගේ බලය හිමි විය. එය තවත් කලෙක යමට, විෂ්ණුට ආදි වශයෙන් පැවරුණි. මේ ආකාරයෙන් වරින් වර බලය එක් එක් දෙවියා කෙරෙහි හුවමාරු වූ බැවින් පාලකයාගේ බලය ද ඒ ඒ දෙවියන්ට අනුරූපව වෙනස් මුහුණුවරක් ගත් බවක් පෙනී යයි.

මහජන සම්මතවාදයට අනුව පාලකයා යනු මිනිස් ප්‍රජාව පාලනය කරන, මිනිස් ප්‍රජාව තුළින් ම ඉදිරියට පැමිණි අයෙකි. නමුත් ඔහුගේ ක්‍රියාකාරකම්වල ගුණ අගුණ මත ඔහු ඇතැම් විටෙක දෙවියන් හා සමාන කිරීමටත් තවත් විටෙක දෙවියන්ටත් වඩා ඉහළ තලයක තැබීමටත් කටයුතු කොට තිබේ. 'රජතුමනි, ඔබ සියලු ගුණවලින් දෙවියන්ටත් වඩා ශ්‍රේෂ්ඨ වෙයි' යන මහාභාරත සඳහනින් රජුගේ ක්‍රියාකාරකම් නිසා ඇතැම් විට ඔහු දේවත්වයෙන් මෙන් ම දේවියන්ටත් වඩා ශ්‍රේෂ්ඨ චරිතයක් ලෙස හුවා දැක් වූ අවස්ථා ද නැත්තේ නොවේ (මහාභාරතය, ශාන්ති පර්වය, (2006), අධ්‍යාය 50. පි. 139).

'යමෙක් මනසෙන් වත් රජුට අනිටු දෙයක් සිතන්නේ ද, ඔහු නිශ්චය ලෙස ම මෙලොව කෙලෙස් විඳ පරලොව නිරයට යයි. පෘථිවිපති රජු මිනිසෙක් යැයි තේරුම් ගෙන කිසිවිටෙකත් ඔහුට අවමන් නොකළ යුතු ය. එයට හේතුව මේ මහා දේවතාවා මිනිස් රූපය දරා මේ පෘථිවියේ වාසය කිරීමයි. රජු ම හැමකල්හී අවස්ථාවට අනුව 'අග්නි, සූර්ය, මෘත්‍යු, වෛශ්‍රවණ - කුවේර හා යමයා' ආදි වශයෙන් පස්වැදෑරුම් පදවි දරයි' (මහාභාරතය, ශාන්ති පර්වය, (2006), අධ්‍යාය 68. පිටු. 196, 197) යනාදි වශයෙන් මහාභාරතයේ එන මෙම ඉගැන්වීමට අනුව රජතුමා මෙලොව දී මානව රූපයෙන් ප්‍රජාව ඉදිරියේ පෙනී සිටිය ද ඔහු සැබවින් ම දෙවියකි. එනිසා ඔහුට මනසින්වත් අවමන් නොකළ යුතු අතර යමෙක් අවමන් කරන්නේ නම් එය දෙවියන්ට කරන ලද අවමන් කිරීමක් ලෙස සලකයි. මනුස්මෘතියට අනුව පාලකයා 'යමයා, සූර්යා, සඳ, මෘත්‍යු, කුවේර සහ අග්නි' යන දෙවිවරුන්ගේ ශක්තීන් හා බලය ගෙන මවන ලද්දෙකි. (මනුස්මෘතිය සහ මානවශිෂ්ටාචාරය, (2001), සත්වන අදියර, ශ්ලෝක 4) වායු පුරාණයත්, විෂ්ණු පුරාණයත් දෙවියන්ගේ කොටස්වලින් ම රජු සෑදුණු බව කියයි. භාගවත පුරාණයට අනුව බ්‍රහ්ම, ශිව, ඉන්ද්‍ර, වරුණ යන දෙවියන් රජුගේ ශරීරය තුළ සිටී.

''යො හි ධර්මපරො රාජා දෙවාංශොන්‍යශ්චරක්ෂසම් - අංශභූතො ධර්මලොපී ප්‍රජාපීඩා කරො භවෙත්'' (ශුක්‍රනීති, (1952), අධ්‍යාය 1. ශ්ලෝක 70) ආචාර්ය 'ශුක්‍රට' අනුව රජකු දෙවියකු හෝ යක්ෂයකු බවට පත්වනුයේ ඔහුගේ පාලනය තුළින් ප්‍රකට කරන ධාර්මික හා අධාර්මික බව මත පදනම්ව ය.

'අඹගමුව' සෙල්ලිපියේදී පළමු වන විජයබාහු රජු තේජසින් හිරුටත්, බලයෙන් මහේශ්වරටත්, අන් අය දමනයෙන් විෂ්ණුටත්, රාජත්වයෙන් ඉන්ද්‍රටත්, ධනයෙන් කුවේරයාටත්, ප්‍රඥාවෙන් බ්‍රහස්පතීටත්, අන් අයට උපකාර කිරීම අතින් බෝධිසත්ත්වයකු හා සමාන වන්නේ යැයි සඳහන් කොට තිබේ (E.Z.Vol. II. (1928), p. 211). මේ අදහස් රජුගේ බල හා ශක්තීන් සම්බන්ධයෙන් මහාභාරතය හා මනුස්මෘතිය දක්වන අදහස්වලට බෙහෙවින් සමාන වේ (මනුස්මෘතිය සහ මානවශිෂ්ටාචාරය, සත්වන අදියර. (2001), ශ්ලෝක 4).

''... සරණනියරැසින් අන්රජමුඳුන් බිසෙස් වූ සභාතෙදින් හිරු පැළකෙවින් මෙහෙසුරු දළදැපින් උවිඳු...'' (E.Z.Vol. III. (1933), p. 320) යනුවෙන් 'දෙවනගල' ශිලාලිපිය තුළ පළමු වන පරාක්‍රමබාහු රජු සම්බන්ධයෙන් එන අදහස මනුස්මෘතියේ ඉහත සඳහන් කළ අදහසට බෙහෙවින්ම සමාන වර්ණනාවකි. අඹගමුව හා දෙවනගල ශිලා ලේඛන දෙකෙහි එන මෙම අදහස්වලින් පළමු විජයබාහු හා පළමු පරාක්‍රමබාහු යන පාලකයන් කෙරෙහි දේවත්ව සංකල්පය තදින් බලපා ඇති ආකාරයක් නිරීක්ෂණය කළ හැකි ය.

ගල්පොත ශිලා ලිපියේ එන ''...රජදරුවන් මනුෂ්‍යරූපයෙන් සිටිය ද නරදෙවතා හෙයින් දෙවියන් වහන්සේ දැක්කැ යුතුයැ'' (E.Z.Vol. II.(1928), p. 108) යනුවෙන් නිශ්ශංකමල්ල රජු තමන් පිළිබඳව කරන ලද සඳහනින් කියා පාන්නේ තමන් මිනිස් රූපයෙන් පෙනී සිටිය ද සැබවින් ම දෙවියකු බවයි. මේ අදහස ද රාජත්වය සම්බන්ධයෙන් මනුස්මෘතියේ එන අදහසකි. රජවරු ද දෙවියන්ම යැයි කල්පනා කළ යුතු බවත් ඔවුන්ට දක්වන බිය හා ගරුත්වය රජවරු සම්බන්ධයෙන් ද දැක්විය යුතු බවත් මෙයින් කියැවෙන අදහසයි. එසේම 'ඇල්ලී' තඹ තහඩු ලිපියේ නිශ්ශංකමල්ල රජු ගැන දැක්වෙන පාලක වර්ණනාව ද පාලකයා දේව ගුණාංගවලට සමීපත්වයක් දැක්වීමට ගන්නා ලද උත්සාහයකි. පළමුවන වික්‍රමබාහු රජු විසින් භාවිත කළ 'පාර්වතීපති දට්ටාසීර් වීර මහාවර්ෂ' සහ 'රාජනාරායන' යන විරුදයන් තුළින් විෂ්ණු හා ශිව දෙවියන් හා සමීප සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. මේ අනුව හින්දු ආභාසයක් මෙන් ම දේවත්වය පිළිබඳ අදහස් මෙම විරුද තුළින් ඉස්මතු වන බව පැහැදිලි ය. පළමු වන වික්‍රමබාහු විසින් භාවිත කළ 'සරණාගත වජ්‍රපඤ්ජර' යන විරුද නාරායන විරුදයට සමගාමී වන බවත් එමගින් ද රාජත්වය තුළ දිව්‍යමය තත්ත්වයක් නිරූපණය වන බවත් වික්‍රමබාහු විසින් එතෙක් පාරම්පරිකව පැවැති බෝධිසත්ත්ව සංකල්පයට දිව්‍යරාජ සංකල්පය ආදේශ කළ බවත් විශ්වාස කළ හැකි ය. බෞද්ධාගමික සම්ප්‍රදාය තුළින් ඉස්මතු වූ බෝධිසත්ත්ව සංකල්පයත්, හින්දු ආගමික සම්ප්‍රදායේ ප්‍රතිමූර්තියක් වූ රාජත්වයේ දිව්‍යමය ස්වරූපයත් සංකලනය වී මෙරට පාලකයන්ට බලපා ඇති බව මෙයින් පැහැදිලි කරගත හැකි ය.

**නිගමනය**

බෝධිසත්ත්ව සංකල්පය හා හින්දු ආගමික සම්ප්‍රදායට අනුගතව ගොඩනැගුණු දේවත්ව සංකල්පයත් මෙරට පාලකයන්ට හා ඔවුන්ගේ පාලන තන්ත්‍රයට බලපා ඇති බව මෙරට සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය තුළින් කරුණු පැහැදිලි කරගත හැකි ය. ප්‍රධාන ආගමික සම්ප්‍රදායන් දෙකක් ඔස්සේ ඉදිරියට පැමිණි මෙම සංකල්ප පාලන නායකත්වයට බලපෑම් කරන ලද්දේ අනුරාධපුර හා පොළොන්නරු රාජධානි අවධීන්වලදී ය. බෝධි සත්ත්ව සංකල්පයේ බලපෑම කෙතෙක් දුරට මෙරට පාලන නායකත්වය හා බද්ධව පැවැතියේ ද යන්න මැනවින් ප්‍රකට කරනුයේ සිරි සංඝබෝධි රාජ චරිතයෙනි. බෝධිසත්ත්ව ගුණයෙන් ඔහුගේ චරිතය උපලක්ෂිත වූ බැවින් පසුකාලීන පාලකයන් අතර වඩාත් ජනප්‍රිය වූ නමුත් ලෞකික දේශපාලන ලෝකය තුළ සිංහාසනයේ වගකීම බැහැර කළ පාලකයෙක් ලෙස ඇතැම් විචාරකයෝ සලකති. බෝධිසත්ත්ව හා දේවත්ව සංකල්පයෙන් හැඩ වූ පළමු වන විජයබාහු, පළමු වන පරාක්‍රමබාහු හා නිශ්ශංකමල්ල වැනි පාලකයන්ගේ චරිත හා පාලන තන්ත්‍ර තුළින් පරාර්ථකාමී බවත් දැඩි පාලන තන්ත්‍රයකුත් ප්‍රකට කරයි. මහා පරාක්‍රමබාහු රජුගේ පාලනය තුළ ඇතැම් විටෙක දැඩි බවක් ප්‍රකට කෙරෙන අතර එම තත්ත්වය දේවත්ව සංකල්පය තුළින් ජනිත කරන ලද එකක් විය හැකි යැයි සැලකිය හැකි ය.

**ප්‍රමුඛ පද** - රාජත්වය, බෝධිසත්ත්ව සංකල්පය, දේවත්ව සංකල්පය, චරිත ස්වභාවය, පාලන තන්ත්‍රය

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍රය

*ඌනපූරණ සහිතො මහාවංසො.* (1959). (සංස්) බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

*දීඝනිකාය.* (තෙවන කොටස), (1976). (පරි) ආනන්ද මෛත්‍රෙය හිමි, බලංගොඩ. කොළඹ: ශ්‍රී ලංකා ජනරජය මගින් ප්‍රකාශිතයි.

*දීපවංසය.* (1959). (සංස්) ඤාණවිමල හිමි, කිරිඇල්ලේ. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*භාෂා ටීකා සහිත ශුක්‍රනීති.* (1, 2, 3, 4), (1952). (සංස්) ශ්‍රී කෘෂ්ණදාස, ඛේමරාජ. කර්තෘ ප්‍රකාශනයකි, ඉන්දියා.

*මනුස්මෘතිය සහ මානව ශිෂ්ටාචාරය.* (2001). (පරි) සෙනෙවිරත්න, නාගොඩ ආරියදාස. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*මහාභාරතය.* (ශාන්ති පර්වය 1 කොටස), (2006). (පරි) පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*මහාවංසය.* ප්‍රථම භාගය, (2014). (සංස්) සුමංගල හිමි, හික්කඩුවේ. සහ දොන් අන්ද්‍රිස් ද සිල්වා බටුවන්තුඩාවේ. කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

*මහාවංසය*, ද්විතීය භාගය. (2015). සංස්. සුමංගල හිමි, හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, දොන් අන්ද්‍රිස් ද සිල්වා. කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

*හත්ථවනගල්ල විහාරවංස.* (2001). (සංස්) අමරතුංග, සරත්චන්ද්‍ර ඒ.ඇම්.ඩී.වයි. කොළඹ: සමයවර්ධන පොත් සමාගම.

### ද්විතීයික මූලාශ්‍රය

මලලසේකර, ගුණපාල. *ලංකා පාලි සාහිත්‍යය.* කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම, 1965.

## English Books

*Epigraphia Zeylanica***.** Vol. 1. (1912). (ed) Wickramasingha, D.M.D.Z. London: Oxford University Press.

*Epigraphia Zeylanica.* Vol. II. (1928). (ed) Wickramasingha, D.M.D.Z. London: Oxford University press.

*Epigarphia Zeylanica.* Vol. III. (1933). (ed) Paranavitana, S. London: Oxford University press.

*Epigraphia Zeylanica***.** Vol. IV. (1944). (ed) Paranavitana, S. London: Oxford University press.

*Epigraphia Zeylanika*. Vol. V. (1966). (ed) Paranavitana, S. Colombo: Department of Archaeology.